අභ්‍යන්තර චක්‍රලේඛ: 2022/14
මගේ අංකය: DMT/H/E/01/01
ආයතන අංශය
දිනය: 2022.11.14

කොමසාරිස් (රියදුරු බලපත්‍ර)

දිස්ත්‍රික් කාර්යාල භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන්

ප්‍රධාන මෝටර් රථ පරීක්ෂකවරුන්

**විදේශීය රියදුරු බලපත්‍ර ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රයට පරිවර්තනය**

මෝටර් වාහන පනතෙහි 131 වන වගන්තියෙහි ප්‍රතිපාදන අනුව ශ්‍රී ලංකාවෙන් පිටතදී නිකුත් කරන ලද ධාවන බලපත්‍රයක් දරණ අයෙකුට ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීමේදී අදාල වන ක්‍රියා පටිපාටිය.

**01. පොදු කරුණු**

අ. පරිවර්තනය සඳහා ඉදිරිපත් කරනු ලබන රියදුරු බලපත්‍රය මෝටර් රථ වාහන පිළිබඳ 1968 වියානා සහ 1949 ජිනීවා සම්මුතීන් අනුව ජාත්‍යන්තර ධාවන බලපත්‍රය පිළිගන්නා උපලේඛන 1 හි සඳහන් රටක් හෝ උපලේඛන 2 හි සඳහන් සාක් කලාපීය රටක් මගින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් විය යුතුයි.

ආ. පරිවර්තනය සිදු කරන දින සිට අවම වශයෙන් වසරක කාලයක් සඳහා විදේශීය රියදුරු බලපත්‍රය වලංගු විය යුතුය.

ඇ. පරිවර්තනය සඳහා සළකා බලනු ලබන්නේ පූර්ණ රියදුරු (full driving license) බලපත්‍ර පමණි. පුහුණු අවසරපත්‍ර/බලපත්‍ර (training/learner's license/permit), ආධුනික බලපත්‍ර (novice license), තාවකාලික බලපත්‍ර (temporary license), පරිවාස බලපත්‍ර (probationary license), හෝ වෙනත් ඒ හා සමාන සීමාකාරී බලපත්‍ර වර්ග පරිවර්තනය සඳහා සළකා බලනු නොලැබේ .

ඈ. පරිවර්තනය සඳහා සළකා බලනු ලබන්නේ යතුරු පැදි සහ සැහැල්ලු වාහන/ද්විත්ව කාර්ය වාහන යන කාණ්ඩ වලට අදාල වාහන පන්ති පමණි.

ඉ. පරිවර්තනයට පාදක කර ගනු ලබන විදේශීය රියදුරු බලපත්‍රයේ ඇති සීමා කිරීම් කොන්දේසි (උපැස් පැළඳීම, ශ්‍රවණාධාර පැළඳීම වැනි), අදාල පරිවර්තනය සිදු කළේ නම්, ඒ ආකාරයෙන්ම ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රයට ද අදාල වේ.

ඊ. ඉදිරිපත් කරනු ලබන විදේශීය බලපත්‍රයේ වලංගුතාවය තහවුරු කිරීම සඳහා අදාල තානාපති කාර්යාලයේ ලිඛිත තහවුරු කිරීමක් ලබා ගැනීම හෝ වෙනත් සුදුසු නියමයක් කිරීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත බලය ඇත.

උ. විදේශීය රියදුරු බලපත්‍රය මත පදනම්ව ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය නිකුත් කිරීම හෝ නොකිරීම, සහ අදාල කොන්දේසි නියම කිරීම පිළිබඳව අවසන් තීරණය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් සතු වේ.

**02. විදේශිකයන් සඳහා විදේශීය රියදුරු බලපත්‍ර පරිවර්තනය**

ඉහත 01. පොදු කරුණු යටතේ සඳහන් සියළුම කොන්දේසි වලට අමතරව පහත කොන්දේසි ද අදාල වේ.

පහත කරුණු අදාල ලේඛන ඉදිරිපත් කිරීම මගින් තහවුරු කළ යුතුයි.

i. අවම වශයෙන් වසරක කාලයක් සඳහා නිකුත් කරන ලද ශ්‍රී ලංකා වීසා.
ii. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය මගින් ශාරීරික හා මානසික යෝග්‍යතාවය තහවුරු කිරීම.
iii. මෝටර් රථ පරීක්ෂකවරයෙකු විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් වීම.
iv. විදේශ රියදුරු බලපත්‍රය, අයදුම්කරුගේ මවු රටෙන් නිකුත් කරන ලද එකක් නොවේ නම්, රියදුරු බලපත්‍රය නිකුත් කරන ලද රට සඳහා, අයදුම්කරු වෙත නිකුත් කරන ලද වීසා (රියදුරු බලපත්‍රයේ වලංගු කාල සීමාවට අදාලව).
v. විදේශික අයදුම්කරුගේ ඉතිරිව ඇති ශ්‍රී ලංකා වීසා කාල සීමාව මත පදනම්ව ස්ථිර ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රයේ වලංගු කාලය තීරණය කරනු ලැබේ.

**03. ශ්‍රී ලාංකිකයන්/ ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියන් සඳහා විදේශීය රියදුරු බලපත්‍ර පරිවර්තනය**

ඉහත 01. පොදු කරුණු යටතේ සඳහන් කොන්දේසි වලට අමතරව පහත කොන්දේසි ද අදාල වේ.

පහත කරුණු අදාල ලේඛන ඉදිරිපත් කිරීම මගින් තහවුරු කළ යුතුයි

i. වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය හා ජාතික හැඳුනුම්පත (ශ්‍රී ලංකා පුරවැසි භාවය).
ii. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය මගින් ශාරීරික හා මානසික යෝග්‍යතාවය තහවුරු කිරීම.
iii. මෝටර් රථ පරීක්ෂකවරයෙකු විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් වීම.
iv. විදේශ රියදුරු බලපත්‍රය නිකුත් කරන ලද රට සඳහා, අයදුම්කරු වෙත නිකුත් කරන ලද වීසා (රියදුරු බලපත්‍රයේ වලංගු කාල සීමාවට අදාලව).

**04. මෝටර් වාහන පනතෙහි 132 වන වගන්තිය අනුව තාවකාලික රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම**

ඉහත 02. i. කොන්දේසිය සම්පූර්ණ නොකරන විදේශීය අයදුම්කරුවන් සඳහා මෝටර් වාහන පනතෙහි 132 වන වගන්තිය අනුව තාවකාලික රියදුරු බලපත්‍රයක් නිකුත් කළ යුතුය. මෝටර් වාහන පනතෙහි 132 වන වගන්තිය අනුව ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා තාවකාලික රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉහත 01. පොදු කරුණු යටතේ සඳහන් ආ සිට උ යන කොන්දේසි ද ඊට අමතරව පහත කොන්දේසි ද අදාල වේ.

i. තාවකාලික රියදුරු බලපත්‍රයක උපරිම වලංගු කාලය, මාස 5 හෝ අයදුම්කරුගේ ශ්‍රී ලංකා වීසා බලපත්‍රයේ වලංගු කාලය යන දෙකෙන් අඩු කාලය කාල සීමාව වේ.
ii. තාවකාලික රියදුරු බලපත්‍රයේ වලංගු කාලය මාස ගණන අනුව ගාස්තු ගෙවිය යුතුයි.

**05. ව්‍යාතිරේක**

අ. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සිදු කරන ලිඛිත ඉල්ලීම් අනුව විදේශ දූත මණ්ඩල සමාජිකයන් හා රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා ඉහත කොන්දේසි නොසළකා ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

ආ. ශ්‍රී ලංකාව සමඟ රියදුරු බලපත්‍ර හුවමාරු ගිවිසුම් වලට එළඹ ඇති, උපලේඛනය 3 හි සඳහන් රටවල් මගින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍ර දරණ එම රටවල පුරවැසියන් සඳහා, අදාල රියදුරු බලපත්‍ර හුවමාරු ගිවිසුම් කොන්දේසි සළකා බලා ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය නිකුත් කිරීම.

ඇ. යම් අයදුම්කරුවෙකු සඳහා විදේශීය රියදුරු බලපත්‍රයේ ඇති බර වාහන පන්ති ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රයට පරිවර්තනය කිරීම අත්‍යවශ්‍ය වන බවට සුවිශේෂී කරුණු ඉදිරිපත් කරනු ලබන අවස්ථාවන්හිදී මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ගේ විශේෂ අනුමැතිය සහ අදාල වාහන පන්ති සඳහා ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම යන කරුණු වලට යටත්ව අදාල පරිවර්තනය කිරීම සළකා බලනු ලැබේ.

**06. සාමාන්‍ය ක්‍රමවේදය යටතේ නව රියදුරු බලපත්‍ර ලබා ගැනීම සඳහා ලියාපදිංචි වන දේශීය හා විදේශීය අයදුම්කරුවන් සඳහා මෙම චක්‍රලේඛයේ කොන්දේසි බාධාවක් නොවේ.**

**නිශාන්ත අනුරුද්ධ වීරසිංහ**
කොමසාරිස් ජනරාල්
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**උපලේඛනය - 1: මෝටර් රථ වාහන පිළිබඳ 1968 වියානා සහ 1949 ජිනීවා සම්මුතීන් අනුව ජාත්‍යන්තර ධාවන බලපත්‍රය පිළිගන්නා රටවල්**

| | | | | |
|---|---|---|---|---|
| ඇල්බේනියා | ක්‍රොඒෂියා | ඉරාන ඉස්ලාමික ජනරජය | මොන්ටිනීග්‍රෝ | සර්බියාව |
| ඇල්ජීරියා | කියුබාව | ඉරාකය | මොරොක්කෝ | සීෂෙල්ස් |
| ආර්ජන්ටිනා | සයිප්‍රස් | අයර්ලන්තය | මියන්මාරය | සියරා ලියොන් |
| ආමීනියාව | චෙක් ජනරජය | ඊශ්‍රායලය | නැමීබියාව | සිංගප්පූරුව |
| ඕස්ට්‍රේලියාව | කොන්ගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජය | ඉතාලිය | නේපාලය | ස්ලෝවැකියාව |
| ඔස්ට්‍රියා | ඩෙන්මාර්ක් | ජැමෙයිකා | නෙදර්ලන්තය | ස්ලෝවීනියාව |
| අසර්බයිජානය | ඩොමින්නිකන් ජනරජය | ජපානය | නවසීලන්තය | දකුණු අප්‍රිකාව |
| බහමාස් | ඉකුවදෝරය | ජෝර්දානය | නයිජර් | ස්පාඤ්ඤය |
| බහරේන් | ඊජිප්තුව | කසකස්ථානය | නයිජීරියාව | බංග්ලාදේශය |
| එස්තෝනියාව | කෙන්යාව | උතුරු මැසිඩෝනියාව | ස්වීඩනය | සිම්බාබ්වේ |
| බාබඩෝස් | ඉතියෝපියාව | කුවේට් | නෝර්වේ | ස්විට්සර්ලන්තය |
| බෙලාරුස් | ෆීජි | කිර්ගිස්ථානය | ඕමානය | සිරියාව |
| බෙල්ජියම | ෆින්ලන්තය | ලාඕසය | පාකිස්ථනය | ටජිකිස්ථානය |
| බෙනින් | ප්‍රංශය | ලැට්වියාව | පැපුවා නිව් ගිනියාව | තයිලන්තය |
| බොස්නියාව සහ හර්සගොවීනා | ජෝජියාව | ලෙබනනය | පැරගුවේ | ටෝගෝ |
| බොට්ස්වානා | ජර්මනිය | ලෙසතෝ | පේරු | ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ |
| බ්‍රසීලය | ඝානාව | ලයිබීරියාව | පිලිපීනය | ටියුනීසියාව |
| බෲනායි | ග්‍රීසිය | ලික්ටන්ස්ටයින් | පෝලන්තය | තුර්කිය |
| බල්ගේරියාව | ගුවාතමාලාව | ලිතුවේනියාව | පෘතුගාලය | තුර්ක්මෙනිස්තානය |
| බූකීර්නා ෆාසෝ | ගයනා | ලක්සම්බර්ග් | කටාර් | උගන්ඩා |
| කේප් වර්ඩේ | හයිටි | මැඩගස්කර් | තායිවානය | යුක්‍රේනය |
| කාම්බෝජය | වතිකානුව | මලාවි | දකුණු කොරියාව | එක්සත් අරාබි එමීර් රාජ්‍ය |
| කැනඩාව | හොන්ඩුරාස් | මැලේසියාව | මෝල්ඩෝවා | එක්සත් රාජධානිය |
| මධ්‍යම අප්‍රිකානු ජනරජය | හොංකොං | මාලි | රුමේනියාව | ඇමරිකා එක්සත් ජනපදය |
| චිලී | හන්ගේරියාව | මෝල්ටාව | රුසියාව | උරුගුවේ |
| කොන්ගෝව | අයිස්ලන්තය | මෙක්සිකෝව | රුවන්ඩාව | උස්බෙකිස්ථානය |
| කොස්ටරීකා | ඉන්දියාව | මොනාකෝ | සවුදි අරාබිය | වෙනිසුවේලාව |
| කෝටේ ඩි අයිවරි | ඉන්දුනීසියාව | මොන්ගෝලියාව | සෙනගාලය | වියට්නාමය |

**උපලේඛනය - 2: සාක් කලාපයේ රටවල්**

ඉන්දියාව

පාකිස්තානය

බංග්ලාදේශය

නේපාලය

භූතානය

මාලදිවයින

ඇෆ්ඝනිස්තානය

**උපලේඛනය - 3: ශ්‍රී ලංකාව සමග රියදුරු බලපත්‍ර හුවමාරු ගිවිසුම් වලට එළඹ ඇති රටවල්**

ඉතාලිය